## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2013

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලිකිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 25 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 02 දිනැති අංක 03/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කලයුතු අතර, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. එසේ වුවද අධිකාරිය විසින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,

වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රමිති

--------------------

වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේදී පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණිත ක්‍රමය යන ක්‍රම දෙකින් එක් ක්‍රමයක් පමණක් අනුගමනය කල යුතු වුවත්, අධිකාරිය විසින් ඉඩම් වලින් කොටසක් පමණක් ප්‍රත්‍යාගණිත ක්‍රමයට අගයකර ගිණුම්ගත කර තිබූ අතර ඉතිරි කොටස පිරිවැය ක්‍රමයට ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණද, වසර තුනෙන් තුනට හෝ පහෙන් පහට වත්කම් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ තැන්පතු (වෙනත්) ගිණුමට හරකල යුතු රු.1,903,439 ක් විවිධ තැන්පතු (පළාත්සභා) ගිණුමට හර කර තිබුණි.

(ඇ) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් පැවති රු.43,678,802 ක් වටිනා කෙරීගෙන යන වැඩ, නිශ්චිතව හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පෙර වර්ෂ ගැලපුම් රු.569,228 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරිමේදී වූ දෝෂ හේතුකොට ගෙන වර්ෂයට අදාල ක්ෂය ආසන්න වශයෙන් රු.මිලියන 9.6 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් වත්කම් විගණනය සඳහා ඉදිරිපත් කල උපලේඛන සමඟ එකඟ නොවූ අතර, එම වෙනස්කම් නිවැරදි කිරීමට දීර්ඝ කාලයක සිට කටයුතු කර නොතිබුණි.

| | **මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය** | **උපලේඛන අනුව ශේෂය** | **වෙනස** |
|---|---|---|---|
| | **රු.** | **රු.** | **රු.** |
| ලීබඩු සහ උපකරණ | 30,610,135 | 31,876,644 | 1,266,509 |
| උපකරණ | 41,017,438 | 41,117,235 | 99,797 |
| වාහන | 98,764,082 | 105,195,204 | 6,431,122 |
| පරිගණක | 8,715,539 | 7,433,125 | (1,282,414) |
| මත්ස්‍ය ටැංකි | 13,726,094 | 8,804,357 | (4,921,737) |
| මත්ස්‍ය පොකුණු | 215,801,277 | 220,508,738 | 4,707,461 |

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොළොන්නරුව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයෙන් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට ලැබීමට ඇති බදු කුළී ආදායම වූ රු.1,612,285 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර දෙකකට වැඩි කාලයක සිට ගෙවීමට ඇති ණය ශේෂ වල වටිනාකම රු.6,922,220 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ධීවර හැඳුනුම්පත් සඳහා ගෙවිය යුතු රු.416,492 ක් මුදල තහවුරු කිරීමට අදාල ලේඛන, ලියකියවිලි හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.371(2)(ඇ) | අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමවූ විගසම නිරවුල් කල යුතු වුවත් අවස්ථා 41 ක දී ලබා දෙන ලද වටිනාකම රු.6,620,807 ක අත්තිකාරම් ඒ අනුව නිරවුල් කර නොතිබුණි. |
| (ii) මු.රෙ.138 | වටිනාකම රු.6,929,962 ක් වූ සහතික නොකල ගෙවීම් වවුචර 13 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය | අධිකාරියේ නිළධාරින් අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව නිදහස් කල නොහැකි බව දක්වා තිබියදීත් ඊට පටහැනිව නිළධාරින් තුන්දෙනෙකු නිදහස් කර වැටුප් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.748,440 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2009 ජුනි 01 දිනැති අංක ඩීඑම්එස්/ඒ/08/21 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 30(1) | සේවක වැටුප් සංශෝධනය කිරීමේදී හා ප්‍රතිකාණ්ඩගත කිරීමේදී නව කාණ්ඩය යටතේ නිළධාරින් වැටුප් පියවරයන්හි පිහිටුවීමේදී, එවකට සේවයේ නිරතව සිටි නිළධාරීන්ගෙන් කොටසක් සඳහා වැටුප් වර්ධක 09 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,099,309 ක් ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,364,390 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,265,082 ක ඌනතාවයේ අඩුවීමක් පෙන්නුම්කර ඇත. ඌනතාවය අඩුවීම ප්‍රතිශතයක් ලෙස සියයට 55 ක් වූ අතර, මෙම වාසිදායක විචලනය සඳහා ප්‍රධාන වශයෙන් ආදායම වැඩිවීම හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

අධිකාරියේ වාර්තා අනුව පසුගිය වර්ෂ 05 ක කාලය තුල මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය පහත පරිදි විය.

| වර්ෂය | කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| | මෙ.ටොන් | මෙ.ටොන් |
| 2009 | 293,170 | 46,560 |
| 2010 | 330,240 | 51,390 |
| 2011 | 381,260 | 59,560 |
| 2012 | 417,220 | 68,950 |
| 2013 | 445,930 | 66,910 |

2012 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 7 කින් වැඩිවී තිබූ අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 3 කින් අඩුවී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විශේෂ අත්තිකාරම්, ඉන්ධන අත්තිකාරම් හා සුළු මුදල් අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.292,346 ක් දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි.

(ආ) දේශීය මිලදී ගැනීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.256,438 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි.

(ඇ) චෙක්පත් මඟින් ගෙවීම් කිරීමේදී බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරී විසින් නිරන්තරයෙන් සොයා බැලිය යුතු වුවත් එසේ සොයා බැලීමකින් තොරව චෙක්පත් ලිවීම හේතුකොටගෙන රු.1,932,930 ක් වටිනා චෙක්පත් අගරු වී තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **විස්තරය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** |
|---|---|---|---|
| මාණ්ඩලික | 88 | 78 | 10 |
| මාණ්ඩලික නොවන | 418 | 365 | 53 |
| එකතුව | 506 | 443 | 63 |

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනයේ රාජකාරී හා වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබූ අතර, ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු ඉටුකිරීම සඳහා සහායක නිලධාරි තනතුරු ඇතුළත් වන ආකාරයට කාර්ය මණ්ඩල අනුමත කර නොතිබුණි.

**5.2 අයවැය පාලනය**

අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුවිය යුතුව ඇත.

(අ) වත්කම්
(ආ) අත්තිකාරම්
(ඇ) බදු දීම
(ඈ) ගිණුම්කරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය